# අපේ ගෙදරට අමුත්තෝ ඇවිත්



තෙනුලි සෙහන්සා කාරියවසම්

# අපේ ගෙදරට අමුත්තෝ ඇවිත්

**තෙනුලි සෙහන්සා කාරියවසම්**

**<u>කතෘගේ වෙනත් කෘති</u>**

**නිවාඩු කාලයේ ලස්සන දවසක්**

**පාසල - මහාමායා බාලිකා විදුහල**

**පන්තිය - 3 ශ්‍රේණිය D**

**පළකරන දිනය 2026-05-10**

**ISBN 978-624-211-045-5**

# පිදුම

පොතක් ලියන්නට

මාගේ ඇස් පෑදූ

ආදරණීය වත්සලා ගුරු මෑණියන්ට

සෙනෙහසින් පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

තෙනුලිගෙයි සෙනුලිගෙයි ගෙදර වටේටම මල්ගස් ගොඩාක් හදලා තිබුණා. මේ නිසා කුරුල්ලෝ , සමනලයෝ , මී මැස්සෝ මේ වත්තට මල් පැණි බොන්න එන්න පුරුදු වෙලා හිටියා.



එක දවසක් වත්තට ගිය තෙනුලි ලස්සන දෙයක් දැක්කා . "අම්මේ , අම්මේ මේ බලන්නකෝ කුරුල්ලෝ" ඇවිත් තෙනුලි කිවුවා. මේක ඇහුණු සෙනුලිත් එතනට දුවගෙන ආවා. "ආ...මේ පැණි කුරුල්ලානේ කූඩුවක් හදන්නේ " අම්මා කිවුවා.



"මොනවාගෙන්ද අම්මේ පැණි කුරුල්ලෝ කූඩු හදන්නේ " තෙනුලි ඇහුවා. "වේලිච්ච කොළ ,ගස්වල පොතු , චූටි කෝටු කැලි, පුලුන් වගේ දේවල් වලින් තමයි පැණි කුරුල්ලා කූඩුව හදාගන්නේ "අම්මා කිවුවා.



"හැමෝම කුරුල්ලෝ මේ වගේ කූඩුවක් හදාගන්න මහන්සි වෙනවාද අම්මේ" තෙනුලි ඇහුවා. නෑ පුතේ සමහර කුරුල්ලෝ හරිම කම්මැළියි. කෝටු කැලි වලින් කපුටාගේ කූඩුව හදාගන්නේ හරිම අපිළිවෙළට. හැබැයි ඊටත් වඩා කම්මැලියා තමයි කොහා. එයා කූඩුවක් හදාගන්නේ නැතිව කපුටාගේ කූඩුවේම බිත්තර දානවා. පොඩි කාලේ දෙගොල්ලම එකවගේ නිසා කපුටු අම්මාට වෙනස හොයාගන්න බෑ. ලොකු වෙනකොට කොහා අම්මාගේ පැටවු කාක් කාක් කියන්නේ නැතිව කොහෝ කොහෝ කියනකොට කපුටු අම්මා කොහා පැටවුන්ට කොටලා එලවා ගන්නවා. මේක අහලා තෙනුලියි සෙනුලිටයි හරි හිනා.



"එතකොට කවුද අම්මේ ලස්සනටම කූඩුව හදන්නේ. තෙනුලි ඇහුවා. "වඩු කුරුල්ලා තමයි ලස්සනම කූඩුව හදන්නේ" අම්මා කිවුවා. "වේලිච්ච තණකොළ ,පන්කොළ වලින් හරිම ලස්සන කූඩුවක් හදනවා. කූඩුව ඇතුළට ආලෝකය ලැබෙන්න ඕන නිසා කණාමැදිරියෙකුත් ගෙනල්ලා කූඩුව ඇතුළෙන් එල්ලනවාලු. වඩු කුරුල්ලා ගොඩාක් නිර්මාණශීලි කුරුල්ලෙක් " අම්මා කිවුවා. මේ දේවල් අහලා තෙනුලිටයි සෙනුලිටයි හරි පුදුමයි.



"හැම කුරුල්ලෙක්ම කූඩුවක් ඇතුළෙද අම්මේ ජීවත්වෙන්නේ"තෙනුලි ඇහුවා.


"නෑ පුතේ සමහර කුරුල්ලෝ කූඩු හදන්නේ නෑ. කොට්ටෝරුවාගේ හොටෙන් ගස් වලට කොටලා බෙනයක් සාදනවා. මේ බෙනය ඇතුළේ තමයි ගිරවු , මයිනෝ වගේ කුරුල්ලෝ බිත්තර දමන්නේ "අම්මා කිවුවා.



වවුලා නිශාචර සතෙක් පුතේ. ඒ කියන්නේ එයා දවල් කාලයට නිදාගෙන රෑට ඇහැරලා තමයි ඉන්නේ. වවුලෝ දවල් කාලයට ලොකු ගස් මුදුන්වල කකුල් දෙකෙන් එල්ලිලා නිදා ගන්නවා. රෑට තමයි කෑම හොයාගෙන යන්නේ.



තාරාවෝ , හංසයෝ වගේ කුරුල්ලෝ කූඩු හදාගන්නේ නෑ. එයාලා ජීවත්වෙන්නේ ජලාශ ආශ්‍රිතවයි.



කිකිළියන් බිත්තර ලබා දීම සඳහා නිවෙස් ආශ්‍රිතව ජීවත්වෙන නිසා බොහෝ විට සිටින්නේ මිනිසුන් සාදා දෙන කුකුල් කූඩු වලයි.



"අපි අද කුරුල්ලන්ගේ කූඩු ගැන ගොඩාක් දේවල් ඉගෙනගත්තා නේද අම්මේ අපිට හරි සතුටුයි"

"ඔව් පුතේ කුරුල්ලෝ සර්පයින් , කටුස්සන් වගේ සතුන්ගෙන් එයාලාගේ බිත්තර පරිස්සම් කරගන්න හරිම අමාරුවෙන් තමයි මේ කුරුලු කූඩු හදන්නේ. අපි ඒ කූඩු කඩලා දාන්න හොඳ නෑ.

එකමුතුකම , ඉවසීම , නිර්මාණශීලිකම අපි කුරුල්ලන්ගෙන් ඉගෙනගන්න ඕන" අම්මා කියලා දුන්නා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

# ස්තූතිය.

අකුරු කරන්නට සෙවණ ලබා දුන් මහනුවර මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමියටත් ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත් කතන්දරයේ අඩුපාඩු පෙන්වා දුන් වත්සලා ගුරුතුමියටත් ආදරණීය අම්මාටත් , තාත්තාටත් සහෝදරියටත් ස්තූතිය පුද කරමි.